සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

නම : ............................................... චිත්‍ර කලාව කාලය : පැය 01 යි.

සැලකිය යුතුයි :

l සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

## I කොටස

l ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන ඡායාරූපයෙහි ඇති කලා කෘතිය සම්බන්ධව පිළිතුරු සපයන්න.



(1) විශාල දාගැබ්වල සතර දිශාවන්ට මුහුණලා මෙම ........................................................................................ නම් සුවිශේෂී නිර්මාණය දැකිය හැක.

(2) මෙහි පාදම කොටස ............................................................................................ වලින් නිර්මාණය කර ඇති අතර ඉහළ කොටස ගඩොලින් නිමවා ඇත.

(3) එම පහළ කොටසෙහි බොරදම් තීරු අතර ........................................................................................ ආදී සත්ව රූප කැටයම් කර ඇති බව දැකිය හැක.

(4) මෙම සුවිශේෂී නිර්මාණයෙහි දෙපස විසිතුරු කැටයම් සහිත ගල් ටැම් වේ. එම කැටයම් සඳහා යොදාගෙන ඇති මෝස්තර අතර ........................................................................................ එක් මෝස්තරයකි.

(5) මෙම සුවිශේෂී කලාත්මක නිර්මාණයන් අතර හොඳම කලාත්මක නිර්මාණය මිහින්තලේ .......................................... ............................................................................ චෛත්‍යය අසල ඇති නිර්මාණය ලෙස හඳුනාගෙන ඇත.

l ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍යවලට ගැළපෙන නිවැරදි වචනය හිස්තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(6) පිත්තල කර්මාන්තයේ දී භාණ්ඩ නිෂ්පාදනය කරන ප්‍රධාන ක්‍රම දෙකකි. එනම් ........................................ සහ වාත්තු කිරීමයි.

(7) පොළොන්නරු යුගයේ නිර්මාණය වූ සඳකඩ පහණෙහි හින්දු ආගමික බලපෑම නිසා අනුරාධපුර යුගයේ සඳකඩ පහණේ සත්වාවලියෙහි තිබූ ........................................................................ රූපය ඉවත් වී ඇත.

(8) දම් වර්ණය සෑදෙන්නේ රතු වර්ණයට ........................................................................ වර්ණය සමානුපාතිකව එකතුවීමෙනි.

(9) චිත්‍රයක ළඟ ඇති වස්තූන් තද වර්ණයෙනුත් ඈතින් ඇති වස්තූන් ලා වර්ණයෙනුත් ඇඳීම වර්ණ .......................................... ........................................................................ ලෙස හඳුන්වයි.

(10) කළුගල් පුවරුවක අඩක් මතුකර කැටයම් කර තිබීම ........................................................................ කැටයමක් ලෙස හැඳින්විය හැක.

I ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.

(11) සකපෝරුව :- ..............................................................................................................................................................

(12) සණ කැපීම:- ..............................................................................................................................................................

(13) සාදිලිංගම් :- ..............................................................................................................................................................


(14) ථූපසරය :- ..............................................................................................................................................................

(15) මස්ජිදය :- ..............................................................................................................................................................


I **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති රූපවලට වඩාත් ගැළපෙන රූපය A, B, C, D, E යන අක්ෂර සහිත රූපවලින් තෝරා එම අක්ෂරය රූපය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.**

16.  (................................)  A

17.  (................................)  B

18.  (................................)  C

19.  (................................)  D

20.  (................................)  E

**ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (4) ලකුණ ද වැරදි නම් (5) ලකුණ ද යොදන්න.**

21. 'කීර්ති මුඛ' යනුවෙන් ද හැඳින්වෙන්නේ කිඹිහි මුහුණයි. ( )

22. ''යාලි රුව'' බොහෝ හින්දු කෝවිල්වල දැකිය හැක. ( )

23. එක වර්ණයක ප්‍රභේද භාවිතයෙන් අඳිනු ලබන චිත්‍ර කොලාජ් චිත්‍ර නම් වේ. ( )

24. ටෙම්ප්ලේට් චිත්‍රයක් නිර්මාණයට යොදා ගත හැකි වඩාත් පහසු මාධ්‍ය දියසායම් ය. ( )

25. පංති කාමරයේ දී ''රිජිෆෝම්' යොදා ගනිමින් උන්නත කැටයමක් පහසුවෙන් කළ හැකි වේ. ( )

**ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ ඇති 'මුද්‍රා නාම' උපයෝගීකරගෙන දී ඇති බුදු පිළිමවල දක්වෙන මුද්‍රාව ලියන්න.**
**(විතර්ක මුද්‍රාව/භූමි ස්පර්ශ මුද්‍රාව/වරද මුද්‍රාව/පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව/ධම්ම චක්ක මුද්‍රාව)**



26. ..................................................



27. ..................................................



30. ............................................



28. ..................................................



29. ..................................................

**ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එය යටින් ඉරක් අඳින්න.**

31. ''අභය මුද්‍රාව'' යොදා ඇති බුදු පිළිමයකට උදාහරණයකි.
   1. සමාධි බුදු පිළිමය
   2. ගල් විහාර හිටි පිළිමය
   3. අවුකන බුදු පිළිමය
   4. තොලුවිල බුදු පිළිමය

32. අනුරාධපුර යුගයට අයත් හොඳම සඳකඩ පහණ හමුවන්නේ
   1. බිසෝ මාලිගය අසළින්ය.
   2. රත්න ප්‍රාසාදය අසළින්ය.
   3. ශ්‍රී මහ බෝධිය අසළින්ය.
   4. ථූපාරාමය අසළින්ය.

33. වෙස් මුහුණු සෑදීමට යොදා ගන්නා දැව වර්ගයකි.

1. රුක් අත්තන 2. කළුවර 3. පිහිඹිය 4. තේක්ක


34. ශෛලිගත නාට්‍යයකට උදාහරණයක් වන්නේ,

1. ''හුණුවටයේ කථාව'' නාට්‍යයයි. 2. ''සිංහබාහු'' නාට්‍යයයි.
3. ''කැලණි පාලම'' නාට්‍යයයි. 4. ''බල්ලොත් එක්ක බෑ'' නාට්‍යයයි.

35. චිත්‍ර කතා ඇඳීම තුළින් ජනප්‍රිය වූ චිත්‍ර ශිල්පියෙකු **නොවන්නේ** මොවුන් අතරින් කවුරු ද?

1. ජනක රත්නායක මහතාය. 2. බන්දුල හරිස්චන්ද්‍ර මහතාය.
3. එස්. පී. චාර්ල්ස් මහතාය. 4. දයා රාජපක්ෂ මහතාය.

**ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති ඡායාරූපය ඇසුරු කර ගනිමින් පිළිතුරු ලියන්න.**



36. මෙම සැරසිල්ල හඳුන්වන්නේ කුමන නමකින් ද? ..........................................................

37. මෙම සැරසිල්ල වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ කිනම් පාරම්පරික කලා කර්මාන්තයක් සඳහා ද?

..........................................................

38. මෙහි දැක්වෙන කාන්තාවන් කුමන හැඩයකට සම්පිණ්ඩනය කර නිර්මාණය කර තිබේ ද? ..........................................................

..........................................................

39. මෙම සැරසිල්ල බහුල ලෙස නිර්මාණය සඳහා යොදාගෙන ඇති යුගය හඳුන්වන්න. ..........................................................

..........................................................

40. පාරම්පරික සිතුවම් හා කැටයම් කලාවට යොදාගෙන ඇති මෙවැනි කාන්තා රූප සමූහයකින් නිර්මාණය වූ තවත් සැරසිල්ලක් ලියන්න. ..........................................................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019


## Third Term Test - Grade 9 - 2019

## චිත්‍ර කලාව

## II පත්‍රය

I ආදර්ශ චිත්‍රය හා ශාලාධිපතිට උපදෙස්

විභාගයට පූර්ව දිනයක කාලච්ඡේදයක් තුළදී මෙම ඇගයීම සිදු කොට චිත්‍ර කලාව I, III යන පත්‍රවල ලකුණු සමඟ එකතු කළ යුතුය.



**සපයාගත යුතු ද්‍රව්‍යඃ**

(1) සුදු පැහැති කඩදාසියකින් ආවරණය කරන ලද හිස් මාරි බිස්කට් පෙට්ටියක්

(2) කුඩා ප්‍රමාණයේ ගස්ලබු ගෙඩියක්

(3) එක් වර්ණයකින් යුත් රෙදිකඩක්

(4) පෝච්චියක සිටවන ලද පත්‍ර තුනක් සහ මලකින් යුත් ඇන්තූරියම් ශාකයක්.

**II පත්‍රය**

(ද්‍රව්‍ය සම්පිණ්ඩන චිත්‍රය) සඳහා ලකුණු ලබාදීමේ නිර්නායක

| | | |
|---|---|---|
| 01. | තලය මත රූප සංරචනය කිරීමේ හැකියාව | ලකුණු 05 |
| 02. | ද්‍රව්‍යන්ගේ පරිමාව හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | ලකුණු 05 |
| 03. | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය<br>පරිමාණ, පර්යාලෝකනය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස් මට්ටම හා අවකාශ භාවිතය | ලකුණු 05 |
| 04. | පැන්සලෙන් රේඛා භාවිතා කිරීමේ හැකියාව හා සමස්ත නිමාව | ලකුණු 05 |

(සම්පූර්ණ ලකුණු 20යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

චිත්‍ර කලාව    කාලය: විනාඩි 40යි.

## II පත්‍රය

උපදෙස්:

- ඔබේ විභාග අංකය හා ශ්‍රේණිය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව සටහන් කරන්න.
- ඔබ ඉදිරියේ ඇති ද්‍රව්‍ය සමූහය පැන්සලෙන් පමණක් රේඛාවෙන් අධ්‍යයනය කරන්න. වර්ණ කිරීම අවශ්‍ය නැත.
- රේඛා අධ්‍යයනයේ දී

  01. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
  02. පරිමාණ, පර්යාලෝකන රීති හා ත්‍රිමාණ ලක්ෂණ පැන්සලෙන් මතු කළ යුතුය.
  03. දෙන ලද ද්‍රව්‍යයන්වල මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම හා සමස්ත නිමාව.

**III පත්‍රය** **කාලය: පැය 2යි.**

සැලකිය යුතුයි.

- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ සඳහන් කරන්න.
- ''අ'' කොටසින් හෝ ''ආ'' කොටසින් හෝ ''ඉ'' කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

**''අ'' කොටස - චිත්‍ර සංරචනය**

1. වෙළඳාම් පොළක අවස්ථාවක්
2. බස් නැවතුමක සිදුවීමක්
3. අභය භූමියක් නරඹන්නෝ
4. වන අසිරිය

**''ආ'' කොටස - මෝස්තර නිර්මාණය**

5. සම්ප්‍රදායික මෝස්තර ඇසුරින් බිත්ති සැරසිල්ලක්
6. සරල සත්ත්ව රූප ඇසුරින් සිඟිති ඇඳුමකට මෝස්තරයක්
7. කොළයක් සහ පෙති පහක් සහිත මලක් යොදා ගනිමින් චීත්ත මෝස්තරයකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්

**''ඉ'' කොටස - ග්‍රැෆික් නිර්මාණ**

8. කතන්දර පොතක මුල් පිටකවරය සඳහා නිර්මාණයක්
9. නවතම සබන් වර්ගයක් සඳහා දවටනයක්
10. ''ජලය පණ මෙන් සුරකිමු'' යන තේමාව යටතේ පෝස්ටරයක්

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

### චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

I කොටස

(1) වාහල්කඩ
(2) ගලින්
(3) ඇත්/මකර/වාමන/සිංහ
(4) කල්ප වෘක්ෂ/කල්ප ලතා
(5) කණ්ඨක චෛත්‍යය
(6) තහඩු / තලන වැඩ
(7) ගව
(8) නිල්
(9) පර්යාව ලෝකනය
(10) අර්ධ උන්නත

(11) වළං කර්මාන්තයේ දී භාවිතා කරන ප්‍රධාන උපකරණයයි.
(12) වෙස් මුහුණු කර්මාන්තයේ දී ලී කඳන් කැබලිවලට කපා ගැනීම
(13) අතීතයේ දී රතු වර්ණය සාදා ගැනීමට යොදාගත් ද්‍රව්‍යයකි.
(14) ස්තූපයේ ආරක්ෂාවට යොදාගත් ගෙය/චේතියඝර නමින්ද හඳුන්වයි.
(15) ඉස්ලාම් බැතිමතුන්ගේ පූජනීය ස්ථානය/මුස්ලිම් පල්ලිය

| | | | |
|---|---|---|---|
| (16) F | (17) D | (18) A | (19) B |
| (20) C | (21) 4 | (22) 4 | (23) 5 |
| (24) 5 | (25) 4 | (26) වරද මුද්‍රාව | (27) විතර්ක මුද්‍රාව |
| (28) භූමි ස්පර්ශ මුද්‍රාව | (29) ධම්ම චක්‍ර මුද්‍රාව | (30) පර දුක්ඛ දුක්ඛිත මුද්‍රාව | (31) 3 |
| (32) 1 | (33) 1 | (34) 2 | (35) 3 |
| (36) පංචනාරී ඝටය | (37) ඇත්දත්/ලී | (38) කළ ගෙඩියක ආභාසය | (39) මහනුවර යුගය |

(40) නව නාරී කුඤ්ජරය/සප්තනාරී පල්ලැක්කිය

| | | |
|---|---|---|
| I කොටස (ලිඛිත) | ලකුණු | 40 |
| II කොටස (ද්‍රව්‍ය ඇඳීම) | ලකුණු | 20 |
| III කොටස (ප්‍රකාශන/මෝස්තර) | ලකුණු | 40 |
| | | 100 |